**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය–2013**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාඨමාලා අත්හැරීම හේතුවෙන් ආපසු ගෙවිය යුතු ශිෂ්‍ය ගාස්තු සඳහා මූල්‍ය කමිටුවේ අනුමැතියකින් තොරව පාඨමාලා ගාස්තු වලින් සියයට 1 ක වෙන් කිරීමක් සිදුකර තිබුණි. 2013 වර්ෂය තුළ මෙසේ කරන ලද වෙන්කිරීම රු.5,264,869 ක් වුවද ආපසු ගෙවූ මුදල රු.186,182 ක් විය. වෙන්කිරීම් සිදුකිරීමේදී ඉදිරියේදී ලැබිය යුතු මුදල් පදනම් කර ගෙන වෙන්කිරීම් කිරීම සිදුකිරීම හේතුවෙන් අධි වෙන්කිරීමක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය ලෙස වත්කම් මිලදී ගත් දිනය පදනම් කරගෙන ක්ෂය කිරීම් සිදුකරන බව ගිණුම් ප්‍රතිපත්ති වල හෙළිදරව් කර තිබුණද, ඉදිකිරීම් සම්බන්ධයෙන් භාවිතයට සුදුසු තත්ත්වයට පත්කල දිනය හඳුනාගැනීමට නොහැකිවීම හා පුස්තකාල පොත් මිලදීගත් දිනය හඳුනා නොගැනීම නිසා සම්පූර්ණ වර්ෂය වෙනුවෙන් ක්ෂය ගණනය කර තිබුණි.

(ඇ) ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාලව කෙටිකාලීන පාඨමාලා ආදායම් හා අනෙකුත් ආදායම් සම්බන්ධයෙන් වියදමට සාපේක්ෂව ආදායම හඳුනාගැනීමේදී ඇස්තමේන්තුගත මුළු වියදමෙන් වාර්තා කරන දිනට සිදුකල වියදමේ ප්‍රතිශතයට සාපේක්ෂව මුළු ආදායමේ ප්‍රතිශතයක් මූල්‍ය ප්‍රකාශන තුළ ආදායම ලෙස හඳුනාගත යුතු වුවද, විශ්වවිද්‍යාලය කෙටිකාලීන පාඨමාලා හා අනෙකුත් ආදායම් හඳුනාගැනීමේදී වියදමට සාපේක්ෂව ආදායම හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුළ මිලදී ගන්නා ලද වත්කම් වලට අදාල කාර්යාල උපකරණ ක්ෂය රු.475,080 ක් අඩුවෙන්ද ලී බඩු උපකරණ ක්ෂය රු.25,354 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ආ) දිගුකාලීන පාඨමාලා ආදායම් ශිෂ්‍ය පාඨමාලා ගාස්තු ආදායම ලෙස මෙහෙයුම් ආදායමට ඇතුලත් විය යුතු වුවද, දිගුකාලීන පාඨමාලා 04 ක ආදායම රු.6,048,642 ක් හා වියදම රු.6,048,642 ක් කෙටිකාලීන පාඨමාලා හා අනෙකුත් මූලාශ්‍ර ආදායම් යටතේ දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන තුළින් වර්ෂයට අදාල සියළු ආදායම් හා වියදම් ඉදිරිපත් කළයුතු වුවද Sustanable energy Engineering MSc පාඨමාලාවට අදාල ආදායම රු.2,433,393 ක් හා වියදම රු.2,374,650 ක් සම්පූර්ණයෙන්ම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර එහි ශුද්ධ ප්‍රතිඵලය කලින් ලද ආදායමක් ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඉ) වවුනියාව හා ගම්පහ අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටි ඉඩම් ප්‍රමාණය වැඩියෙන් දක්වා ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් වටිනාකම රු.585,500 කින් වැඩියෙන් දක්වා තිබුණද 2013 දෙසැම්බර් 31 දක්වාම නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය ශිෂ්‍ය ගාස්තු අයකර ගැනීමේදී එක් අධ්‍යයන වර්ෂයක ශිෂ්‍ය ගාස්තුව වාරික 02 කින් අය කරනු ලබන අතර පළමු වාරිකය ගෙවීමෙන් පසු එය ආදායම් ලෙස සැලකුවද දෙවන වාරිකය සඳහා වවුචර යවන අවස්ථාවේදීම ආදායම් ගිණුමට බැර කර එම ප්‍රමාණය ලැබිය යුතු ආදායම් ලෙස සැලකීම විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය වේ. සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය ගාස්තු ආදායම රු.609,989,377 වූ අතර එයින් වර්ෂය අවසානයට ලැබිය යුතු ශිෂ්‍ය ගාස්තු ප්‍රමාණය රු.219,502,265 ක් හෙවත් සියයට 36 ක් ඉකුත් වර්ෂ ගණනකට පෙර සිට ලැබිය යුතුව තිබූ ශිෂ්‍ය ගාස්තු වේ. පාඨමාලා අත්හල සිසුන්ගෙන් අයවිය යුතුව තිබූ ශේෂයන් ද මෙහි නියෝජනය වන බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාල සේවකයින්ට ලබා දී තිබූ ආපදා ණය, වාහන ණය හා කාර්යමණ්ඩල ණය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛනය අනුව 2013 දෙසැම්බර් 31 දිනට අය නොවන ණය ශේෂය රු.760,408 ක් වූ අතර ඒ තුළ වසර 21 ක සිට පැවත එන ණය ශේෂය රු.33,907 ක් හා වසර 5 ක් ඉකුත් වූ ණය ශේෂය රු.522,518 ක් විය. එසේම එකතුව රු.160,596ක් වූ ණය ශේෂ 26 ක් අයකර ගත නොහැකි ලෙස හඳුනාගෙන තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවෘත විශ්වවිද්‍යාලයේ වත්කම් ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් 2013 වර්ෂයේ ඉදිරිපත් කරන ලද තක්සේරු දෙපාර්තමේන්තුවේ අතුරු වාර්තා අනුව ඉඩම් වටිනාකම රු.102,729,215 කින් හා ගොඩනැගිලි වටිනාකම රු.1,557,533,204 කින් අඩුවිය යුතු බව මූල්‍ය ප්‍රකාශන සටහන් මඟින්ද පෙන්වාදී තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු නිමකර සම්පූර්ණ වාර්තාව (2014 අගෝස්තු 22 දින) වන විටද ඉදිරිපත් කර නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, සමුච්චිත ක්ෂය හා ප්‍රත්‍යාගණන සංචිතය යන ශේෂයන්හි නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ඇ) දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය මඟින් ලැබුණු රු.2,868,447,927 ක් වූ වත්කම් වලින් රු.28,259,433 ක් වටිනා කාර්යාල බෙදා වෙන්කිරීම් සහ ගෘහ භාණ්ඩ විශ්වවිද්‍යාලය සතුව පවතින බවට තහවුරු කරගෙන නොතිබුණි. එසේම රු.175,907,897 ක් වූ තොරතුරු තාක්ෂණ උපකරණ (ICT Equipment) වල වටිනාකම් සඳහන් නොකර ප්‍රමාණයන් පමණක් දක්වා උපලේඛනයක් පමණක් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | |
| 7.12.1 වගන්තිය | පර්යේෂණ උපකරණ මිලදීගැනීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් 18 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවා තිබුණද සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් පමණක් මිලගණන් ඉදිරිපත් වී තිබුණි. මෙම ආයතන දෙකින් එක් එක් අයිතමයට අදාලව වෙන්ව මිලගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයට ඇණවුම භාරදී තිබූ අතර එම ආයතනයේ සමහර අයිතමයන් මිලගණන් ඉදිරිපත් කර තිබූ අනෙක් ආයතනයේ එම අයිතමයන්ට වඩා වැඩිවීම හේතුවෙන් රු.279,118 ක් වැඩියෙන් ගෙවා තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටුව වැඩි මිල අයිතමයන් එම ආයතනයෙන්ම මිලදී ගැනීමට හේතුන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහය | |
| XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට 2013 වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.486,147,743 ක් ගෙවා තිබුණද විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය ප්‍රකාරව පැමිණීම සටහන් කිරීම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවිණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.150,823,116 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.89,968,693 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.60,854,423 ක වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය ගාස්තු ආදායම රු.304,520,140 කින්ද රාජ්‍ය ප්‍රදාන රු.181,615,000 කින්ද වැඩිවීම සහ ක්ෂය වීම් රු.240,943,682 ක අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වාසිදායක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

විවෘත විශ්වවිද්‍යාලයේ 2011 සිට 2016 දක්වා කාලයට අදාල සංයුක්ත සැලැස්ම හා 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පාඨමාලා සංශෝධනයන් හා මුද්‍රණ කටයුතු කලයුතු කාලපරිච්ඡේදයන් දක්වා තිබුණද අධ්‍යාපන පීඨය, ඉංජිනේරු හා තාක්ෂණ පීඨය හා විද්‍යුත් හා පරිගණක ඉංජිනේරු සංවර්ධන අංශය සමාලෝචිත වර්ෂයේදී එකී සංශෝධනයන් සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශිය කාර්යාලවල සහ අධ්‍යයන මධ්‍යස්ථාන 20 ක් තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දුරස්ථ අධ්‍යාපන පරිගණක පිවිසුම් මධ්‍යස්ථාන (NODES Access Centers) පවත්වා ගෙන යනු ලබන අතර, එම මධ්‍යස්ථාන සඳහා විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති ගොඩනැගිලි ඉඩම් පහසුකම්, විදුලිය, ජලය, ආරක්ෂක හා සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල වූ රු.36,993,600 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලීය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විදේශිය ශිෂ්‍යත්ව ලබාදීමේදී නිලධාරින් 38 දෙනෙකු සමඟ එළඹ තිබූ ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු එකතුව රු.94,665,185 කින් නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.10,673,950 ක මුදල අයකර ගැනීම සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ග සතුටුදායක තත්ත්වයක නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනධ්‍යන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලය තුළ එක් එක් අංශ අතර මාරු කරමින් සේවකයන්ගේ වෘත්තීය දක්ෂතා වර්ධනය කරවීම හා කාර්යක්ෂම සේවාවක් ලබාගැනිම තුළින් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමුකර නොතිබුණි. සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව නිලධාරින් 14 දෙනෙකු වසර 10 කට වැඩි කාලයක සිටද නිලධාරින් 10 දෙනෙකු වසර 20 කට වැඩි කාලයක සිටද එකම අංශයක සේවයේ යොදවා තිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් පරිහරණය නොකරන රු.13,792,455 ක් වටිනා ඉඩම්වල අයිතිය නිත්‍යානුකූලව පවරා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලීය ඉඩම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතුව වාහන 28 ක් පවතින අතර ඉන් වාහන 03 ක් නිලධාරීන් තිදෙනෙකු සඳහා වෙන්කර තිබුණි. ඉතිරි වාහන 25 න් වාහන 17 ක් පීඨ 04 ට ඇතුළුව වෙනත් අංශ වලට අනුයුක්ත කර තිබුණි. එම වාහන සඳහා ඉන්ධන සීමාවන් තීරණය කර තිබූ අතර එම සීමාවන් ඉක්මවා ඉන්ධන භාවිතා කර තිබූ අවස්ථාවන් නිරීක්ෂණය විය.

(ඇ) විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මධ්‍යස්ථාන 17 ක් පවත්වාගෙන යනු ලබන රජයට අයත් ඉඩම් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබූ අතර එම ඉඩම් තක්සේරුකර ගිණුම් වල හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයට අදාල මිලදී ගැනීම් සියල්ලම සැපයීම් අංශයෙන් සිදුකලයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී රු.17,904,626 වටිනා පොත් පුස්තකාලය විසින් සෘජුවම සිදුකර තිබුණි.

(ඉ) අරමුදල් කළමනාකරණය හා පාලනය දුර්වල මට්ටමක පැවති අතර එකතු වටිනාකම රු.43,921,008 ක් වූ අරමුදල් 46 ක් වර්ෂය තුළ අක්‍රියව පැවතුණි. මේ තුළ වටිනාකම රු.4,362,386 ක් වූ අරමුදල් 12 ක් වසර 06 කට වැඩි කාලයක්ද වටිනාකම රු.5,883,691 ක් වූ අරමුදල් 08 ක් වසර 05 සිට වසර 06 දක්වාද වටිනාකම රු.33,674,331 ක් වූ අරමුදල් 26 ක් වසර 01 සිට වසර 03 දක්වා කාලයක්ද අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

විවෘත විශ්වවිද්‍යාලයේ 2013 වර්ෂයේදී සප්ත වාර්ෂික නිවාඩු පදනම යටතේ කාර්ය පැවරුම් මත නිලධාරීන් තිදෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි. එම නිලධාරින් සේවය කල විශ්වවිද්‍යාලයෙන් සහ කාර්ය පැවරුම් මත සේවය කරන විශ්වවිද්‍යාලයෙන් යන ආයතන දෙකෙන්ම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකුට අධ්‍යයන දීමනාව, ජීවන වියදම් දීමනාව හා සියයට 15 විශේෂ දීමනාව ගෙවා තිබීම හේතුවෙන් නිලධාරීන්ට හිමි දීමනාවට වඩා රු.1,590,105 ක් වැඩියෙන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකුට ජීවන වියදම් දීමනාව හා සියයට 15 විශේෂ දීමනාව ගෙවාතිබීම හේතුවෙන් ඔවුන්ට හිමි දීමනාවට වඩා රු.124,775 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 4.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් යටතේ විශ්වවිද්‍යාලයේ ඇසුරුම් අංශය සඳහා 2009 වර්ෂයේ රු.5,308,800 ක් වටිනා කුඩා බන්ඩල් ඇසුරුම් යන්ත්‍ර 03 ක් ලබා දී තිබූ අතර යන්ත්‍ර 02 ක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මොඩියුල 02 සපයා නොමැති හෙයින් එදින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වාම ක්‍රියාත්මක කල නොහැකිව අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

විවෘත විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 1,240 ක් වූ අතර ඉන් 184 ක් එනම් සියයට 15 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතරින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියයට 15 ක් ද අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සියයට 06 ක්ද පරිපාලන කාර්ය මණ්ඩලයේ සියයට 25 ක් සහ අනධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සියයට 16 ක්ද වශයෙන් ආංශිකව ඉහළ පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරි සැලැස්ම

2013 ක්රියාකාරි සැලැස්ම මගින් සපුරා ගැනීමට අපේක්ෂාකල කාර්යයන් 295 න් කාර්යයන් 64 ක් සපුරාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම තවත් කාර්යයන් ගණනාවකට අදාලව කාර්යසාධනයන් විගණනය වෙත ලබාදුන් කාර්යසාධන වාර්තාවේ ඇතුළත්කොට නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

2013 වර්ෂය සඳහා විෂයයන් 07 ක් යටතේ අභ්‍යන්තර විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කර තිබුණු අතර ඊට අමතරව විශේෂ විමර්ශනයන් විෂයයන් 03 ක් යටතේ සිදුකර තිබුණි. විගණන සහකාර තනතුර 2012 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර තිබුණද 2013 දෙසැම්බර් 31 දින දක්වාම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

2013 වර්ෂයේ ආදායම් මුලාශ්‍ර 13 ක් සඳහා ඇස්තමේන්තුගත ආදායම හා වියදම, සත්‍ය ආදායම හා වියදම අතර සැසඳීමේදී සියයට 23 සිට සියයට 1029 දක්වා විචලනයන් නිරීක්ෂණ වූ අතර වියදම් ශීර්ෂ 03 ක් සඳහා ඇස්තමේන්තු සිදුකිරීමකින් තොරව රු.327,897 ක් වැයකර තිබීම නිසා විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) අරමුදල් පාලනය
(ආ) මුදල් හා බැංකු කටයුතු
(ඇ) මුද්‍රණාල කටයුතු
(ඈ) කාර්ය මණ්ඩල පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) ගබඩා පාලනය